2

විශේෂ සටහන 3

## බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථායිතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකු අංශය ඒකාබද්ධ කිරීම

### පසුබිම

2025 වසර අවසන් වන විට ආසන්න වශයෙන් රුපියල් ට්‍රිලියන 25ක වත්කම් සහිත ශ්‍රී ලංකාවේ බැංකු අංශය බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විතව මූල්‍ය පද්ධතියේ ප්‍රමුඛත්වය දරන අතර, මූල්‍ය පද්ධතියේ මුළු වත්කම්වලින් විශාලතම කොටසට (61%) හිමිකම් කියයි. පරිමාණය, අන්තර් සම්බන්ධතාවය, ආදේශන හැකියාව සහ සංකීර්ණත්වය මත පදනම්ව, වර්තමානයේ, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු 5ක් පමණක් දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු (D-SIBs) ලෙස නම් කර ඇත. එසේම, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු කිහිපයක් වත්කම් ප්‍රමාණය සහ ප්‍රාග්ධන පදනම අනුව සාපේක්ෂව තවදුරටත් කුඩා මට්ටමක පවතී. මෙම ව්‍යුහාත්මක සීමාව, මූල්‍ය කම්පන අවශෝෂණය කරගැනීමට සහ ආර්ථික ආතති කාල පරිච්ඡේදවලට ඔරොත්තු දීමට ඔවුන්ගේ ඇති හැකියාව සීමා කරයි. මෙවැනි වාතාවරණයක් තුළ, ශක්තිමත් ශේෂ පත්‍ර, විවිධාංගීකරණය වූ බැංකු ව්‍යාපාර කළඹ සහ ශක්තිමත් යහපාලන සහ අවදානම් කළමනාකරණ රාමු සහිත විශාල බැංකු පැවතීම වඩාත් වැදගත් වී තිබේ. එවැනි ආයතන මගින් මූර්ත ආර්ථිකයට සිදුවන වක්‍ර අවදානම් අවම කිරීම තුළින් බැංකු අංශයේ සමස්ත ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරනු ඇත. තවද, මෙය ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ ශක්තිමත් පැවැත්මක් සඳහා පහසුකම් සපයන අතරම, මහජන විශ්වාසය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

### මූල්‍ය අංශයේ ඒකාබද්ධ කිරීම පිළිබඳ කලාපීය අත්දැකීම්[1]

මේ සම්බන්ධයෙන් ආසියානු කලාපීය අත්දැකීම් සලකා බැලීමේදී, කලාපයේ රටවල් කිහිපයක් මූල්‍ය පද්ධති ශක්තිමත් කිරීම සහ තිරසාර වූ ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා පියවරක් ලෙස, බැංකු අංශය ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් සිදු කර ඇත. උදාහරණයක් ලෙස, ඉන්දියාව සිය ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට දායකත්වය ලබා දෙමින් බැංකුවල කාර්යක්ෂමතාව, ලාභදායීතාවය වැඩිදියුණු කිරීම සහ එහි බැංකුවල ගෝලීය තරගකාරිත්වය ශක්තිමත් කිරීම අරමුණු කරගත් බැංකු ඒකාබද්ධ කිරීම් මාලාවක් හරහා බැංකු අංශයේ ඒකාබද්ධ කිරීම අනුගමනය කර ඇත. ඒ අනුව, ඉන්දීය රජය විසින් දරන ලද ඒකාබද්ධ කිරීමේ ප්‍රයත්නයන් හේතුවෙන් 2017 දී 27ක්ව පැවති රාජ්‍ය අංශයේ බැංකු සංඛ්‍යාව 2020 වන විට 12 දක්වා අඩු කිරීමට හැකි වී ඇති අතර, එමගින් රාජ්‍ය අංශයේ විශාලතම බැංකුවලට ශක්තිමත්, වඩාත් ඔරොත්තු දිය හැකි සහ වඩාත් තරගකාරී ආයතන බවට පත් වීමට හැකි විය. නේපාල රාෂ්ට්‍ර බැංකුව ද 2011 දී ඒකාබද්ධ ප්‍රතිපත්තියක් හඳුන්වා දුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස නේපාලයේ මූල්‍ය ආයතන සංඛ්‍යාව අඩු වී ඇත. සිංගප්පූරුව 2000 දශකයේ මුල් භාගයේ දී බැංකු අංශය ලිබරල්කරණ වැඩසටහනකට සමගාමීව එහි ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක කළේය. මෙම ක්‍රියාවලිය මගින් දේශීය බැංකු සමූහ 6ක් ප්‍රධාන දේශීය බැංකු සමූහ 3කට අඩු කරන ලදී (DBS Bank Ltd., Oversea-Chinese Banking Corporation Ltd. and United Overseas Bank Ltd.). එය වර්තමානයේ පවත්නා වූ වඩාත් ඒකාබද්ධ බැංකුකරණ වාතාවරණයකට මඟ පෑදූ අතර, බැංකුවල හැකියාවන් ශක්තිමත් කිරීමට, කාර්යක්ෂම කළමනාකරණ කණ්ඩායම් ගොඩනැගීමට සහ සමස්ත මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සඵලතාව වැඩිදියුණු කිරීමට හේතු විය. 1997 දී මැලේසියාව ද තම මූල්‍ය අංශය විධිමත් කිරීම සඳහා මෙවැනිම ඒකාබද්ධ කිරීමේ වැඩසටහනක් ආරම්භ කළේය. ඒ අනුව, 1998 වන විට, මූල්‍ය සමාගම් සංඛ්‍යාව 39 සිට 8 දක්වා අඩු වූ අතර, අවසානයේ සියලුම මූල්‍ය සමාගම් වාණිජ බැංකු සමඟ ඒකාබද්ධ විය. 2000 වන විට, මැලේසියාවේ බැංකු ආයතන 54න් 50ක් බැංකු සමූහ 10කට ඒකාබද්ධ කරන ලදී. ආසියානු මූල්‍ය අර්බුදයෙන් පසුව, තායිලන්තය, දකුණු කොරියාව, ඉන්දුනීසියාව සහ පිලිපීනය ඇතුළු තවත් ආසියානු රටවල් කිහිපයකම මේ හා සමාන මූල්‍ය අංශ ඒකාබද්ධ කිරීමේ ප්‍රයත්නයන් නිරීක්ෂණය වී තිබේ.

ශ්‍රී ලංකාවට ද මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් අත්දැකීම් ඇති අතර, 2014 රජයේ අයවැයෙන් ප්‍රකාශයට පත් කළ පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය එක්ව 2014 වසරේ දී මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් බැංකු නොවන මූල්‍ය ආයතන ඉලක්ක කරගත් අතර, සාර්ථක ඒකාබද්ධ කිරීම් කිහිපයක් තිබියදී වුවත්, එය තවදුරටත් සමාලෝචනය කරන තෙක් අත්හිටුවන ලදී. කෙසේ වෙතත්, 2015 වසර තුළ දී ඩී.එෆ්.සී.සී බැංකුව සහ ඩී.එෆ්.සී.සී වර්ධන බැංකුව ඒකාබද්ධ වීමෙන් අනතුරුව ඩී.එෆ්.සී.සී බැන්ක් පී.එල්.සී නමින් ස්ථාපිත විය. තවද, සීමාසහිත MBSL සේවින්ග්ස් බැංකුව, ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් පී.එල්.සී සහ සීමාසහිත MCSL මූල්‍ය සමාගම සමඟ ඒකාබද්ධ කිරීමෙන් මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී ස්ථාපිත කරන ලද අතර, එය ලංකා බැංකුවේ පරිපාලිතයක් වේ. තවද, 2019 දී ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ කරන ලදී.

---

[1] මූලාශ්‍ර:

- Annual Report of Central Bank of Sri Lanka, 2014 and 2015.
- Deepthi, C. A., Sindhu, K. P. & John, B. M., 2024. Public Sector Bank Mergers in India since 2020. *Journal of Visual and Performing Arts,* 5(1), pp. 3510-3515. Available at https://www.researchgate.net/publication/395982482_PUBLIC_SECTOR_BANK_MERGERS_IN_INDIA_SINCE_2020
- Nepal Rastra Bank, 2022. *Optimal number of banks and financial institutions in Nepal.* Available at https://www.nrb.org.np/contents/uploads/2022/04/Optimal-Number-of-Banks-and-Financial-Institutions-in-Nepal.pdf
- Speech by Siriwardana, C. J. P., former Assistant Governor of the Central Bank of Sri Lanka on Financial Sector Consolidation – Why and How? at the Central Bank of Sri Lanka 64th anniversary oration, September 2014. Available at https://www.bis.org/review/r141103g.pdf

2

### ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ ඛණ්ඩනය වූ ස්වභාවය

ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ වත්මන් ව්‍යුහය බෙහෙවින් ඛණ්ඩනය වී ඇත. ඒ අනුව, විශාලතම බැංකු 6 බැංකු අංශයේ මුළු වත්කම්වලින් ආසන්න වශයෙන් 75%ක් නියෝජනය කරන අතර, ඉතිරි බැංකු 24, 25%ක වෙළඳපොළ කොටසක් සඳහා තරග කරයි. (වි.ස. 3.1 වගුව)

ඒ අනුව, බැංකු අංශයේ ඛණ්ඩනය වූ ස්වභාවය, මෙහෙයුම් අකාර්යක්ෂමතා, සම්පත්වල සීමිත බව, තොරතුරු තාක්ෂණ පද්ධතිවල අඩුපාඩු සහ ප්‍රමාණවත් නොවන වෙළඳපොළ කොටස වැනි සාධක හේතුවෙන් මූල්‍ය පාරිභෝගික අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීමට සහ පුළුල් ආර්ථික වර්ධනයට දායක වීමට බලපත්‍රලාභී බැංකුවලට ඇති හැකියාව සීමා කරයි. මෙය, මූල්‍ය පද්ධතිය පුරා අවදානම් සම්ප්‍රේෂණය කළ හැකි අභ්‍යන්තර හා බාහිර කම්පන දෙකටම ශක්තිමත්ව මුහුණ දීමට බැංකු අංශයේ සමස්ත ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ශක්තිමත් ශේෂ පත්‍ර, යහපාලනය සහ අවදානම් කළමනාකරණ රාමු සහිත විශාල බැංකු සඳහා ඇති අවශ්‍යතාවය වර්ධනය කරයි.

### 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් බලපත්‍රලාභී බැංකු සඳහා බැංකු අංශය ඒකාබද්ධ කිරීම සඳහා වන රාමුව නිකුත් කිරීමට 2025 ඔක්තෝබර් මාසයේදී අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 දෙසැම්බර් 12 දිනැති ලිපියක් මගින් ලකුණු ක්‍රමයක් මත පදනම් වූ අර්ධ වාර්ෂික ඇගයීම පිළිබඳව දේශීයව සංස්ථාපනය කරන ලද කුඩා ප්‍රමාණයේ බැංකු වෙත දැනුම් දෙන ලදී. පසුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ සුරක්ෂිත බව සහ ශක්තිමත් බව තහවුරු කිරීමට බැංකු අංශය ඒකාබද්ධ කිරීම සඳහා සුදුසු උපායමාර්ග අනුගමනය කරන ලෙසට බලපත්‍රලාභී බැංකුවලට දන්වමින්, 2026 ජනවාරි 23 වන දින බැංකු අංශය ඒකාබද්ධ කිරීම සඳහා වන රාමුවක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. බැංකු අංශය ඒකාබද්ධ කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද රාමුවේ කැපී පෙනෙන ලක්ෂණ පහත දැක්වේ.

- දේශීයව සංස්ථාපනය කරන ලද කුඩා පරිමාණ බලපත්‍රලාභී බැංකු ස්වයං තක්සේරුවකින් සහ නියාමන තක්සේරුවකින් සමන්විත ලකුණු ක්‍රමයක් මත පදනම්ව අර්ධ වාර්ෂිකව ඇගයීමට ලක් කෙරේ. බලපත්‍රලාභී බැංකු විසින් පවත්වනු ලබන ස්වයං තක්සේරුව සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක නිර්ණායක නිශ්චිතව දක්වා ඇති අතර, ප්‍රාග්ධනය, ලාභදායීතාවය, වත්කම්වල ගුණාත්මකභාවය, ද්‍රවශීලතාවය සහ සංකේන්ද්‍රණය ප්‍රමාණාත්මක නිර්ණායක ලෙසද, ප්‍රමාණවත් පහසුකම් නොලැබෙන පාරිභෝගික කොටස් සඳහා සේවා සැපයීම, ව්‍යාපාර ආකෘති තිරසාරභාවය, කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය ගුණාත්මක නිර්ණායක ලෙසද දක්වා ඇත. තවද, නියාමන තක්සේරුව සඳහා අවදානම් කළමනාකරණය, සම්පත්වල ප්‍රමාණවත් බව සහ බලපත්‍රලාභී බැංකුවල නියාමන සහ සාර්ව ආර්ථික පරිසරය සලකා බලනු ලැබේ.
- මේ සම්බන්ධයෙන්, අනෙකුත් පියවරයන්ට සමගාමීව, ලකුණු ක්‍රමයට අනුව කලින් තීරණය කරන ලද සීමාවකට වඩා අඩු ලකුණු සංඛ්‍යාවක් අඛණ්ඩව ලබා ගන්නා බලපත්‍රලාභී බැංකු සඳහා අනිවාර්ය ඒකාබද්ධ කිරීම සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ඇත.
- තවදුරටත්, එක් එක් බැංකුවේ වත්කම් ප්‍රමාණයට සමානුපාතිකව ඒකාබද්ධ කිරීමේ උපාය මාර්ග අනුගමනය කිරීම සඳහා මෙම රාමුව බලපත්‍රලාභී බැංකු වෙත පහසුකම් සපයන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබා ගැනීම, මානව සම්පත් කළමනාකරණයට අදාළ විය හැකි ගැටළු විසඳීම, තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ සාධාරණ වෙළඳපොළ හැසිරීම යනාදිය ඇතුළුව ඒකාබද්ධ කිරීම පිළිබඳ පුළුල් මගපෙන්වීමක් සපයයි.

වි.ස. 3.1 වගුව

**2025 දෙසැම්බර් 31 දිනට බැංකු අංශයේ සංයුතිය**

| වර්ගය | වත්කම් ප්‍රමාණය | බැංකු සංඛ්‍යාව | වෙළඳපොළ කොටස |
|---|---|---|---|
| විශාල බැංකු | රු. ට්‍රිලියන 3ට වැඩි | 3 | 50.0% |
| | රු. ට්‍රිලියන 2 - රු. ට්‍රිලියන 3 | 1 | 9.6% |
| | රු. ට්‍රිලියන 1 - රු. ට්‍රිලියන 2 | 2 | 15.3% |
| මධ්‍යම බැංකු | රු. බිලියන 400 - රු. ට්‍රිලියන 1 | 5 | 16.3% |
| කුඩා බැංකු | රු. බිලියන 200 - රු. බිලියන 400 | 4 | 5.0% |
| | රු. බිලියන 100 - රු. බිලියන 200 | 2 | 1.3% |
| | රු. බිලියන 100ට අඩු | 13 | 2.5% |
| | **එකතුව** | 30 | 100% |

- මෙමගින් බලපත්‍රලාභී බැංකුවල ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථායීතාවය ශක්තිමත් කිරීමේ අරමුණින්, ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම් හරහා වර්ධනය සවිමත් කිරීම, යහපාලන සහ අවදානම් කළමනාකරණ උපායමාර්ග ශක්තිමත් කිරීම, තාක්ෂණික හැකියාවන් දියුණු කිරීම, නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රාග්ධන ප්‍රවේශය වැඩිදියුණු කිරීම සිදු කරනු ලබයි.

මෑතකදී, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද බැංකුවක පුද්ගල කේන්ද්‍රීය ව්‍යාපාර කළඹ දේශීය පෞද්ගලික බැංකුවකට පැවරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පහසුකම් සැලසීය. තවද, ශ්‍රී ලංකා රජය විසින් රාජ්‍ය අංශයේ කුඩා විශේෂිත බැංකු 2ක් ප්‍රතිව්‍යුහගත කිරීම අනුමත කර ඇති අතර, ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ ශක්තිමත්භාවය තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් එවැනි ක්‍රියාමාර්ග සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පහසුකම් සපයනු ඇත.

### බැංකු අංශය ඒකාබද්ධ කිරීමේ අපේක්ෂිත ප්‍රතිලාභ

බැංකු අංශය ඒකාබද්ධ කිරීමේ රාමුව යටතේ දිරිමත් කරන ලද උපායමාර්ග මගින් විශේෂයෙන් ප්‍රාග්ධනය, ව්‍යාපාර ආකෘති තිරසාරභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයට අදාළ අභියෝගවලට මුහුණ දෙන කුඩා පරිමාණ දේශීය බලපත්‍රලාභී බැංකු, විශාල හා ශක්තිමත් බැංකු විසින් අවශෝෂණය කරගැනීමට පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මෙම රාමුව විශාල බැංකු 2ක් හෝ වැඩි ගණනක් ඒකාබද්ධ කිරීම හරහා විශාල බැංකු තවදුරටත් පුළුල් කිරීම දිරිමත් නොකරයි.

ඒ අනුව, අනපේක්ෂිත අලාභ සහ විභව අවදානම් අවශෝෂණය කරගැනීමට හැකියාව ඇති ප්‍රමාණවත් ස්වාරක්ෂක සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණ සහිත මනාව ප්‍රාග්ධනීකරණය වූ බැංකු ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන අතර, එමගින් බැංකු අංශයේ සමස්ත ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

තවද, පිරිවැය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ මහ පරිමාණ පිරිමැසුම් හරහා අඩු පොලී ආන්තිකයන්ට දායක වීම මගින් කාර්යක්ෂම මූල්‍ය අතරමැදිකරණයට සහාය වීම, බැංකු අංශය ඒකාබද්ධ කිරීම තුළින් අපේක්ෂා කෙරේ. සේවා නොලද සහ ඌන සේවා ලාභී වෙළඳපොළවලට වඩා හොඳින් සේවය කිරීමට බැංකු අංශයට හැකි වන පරිදි තාක්ෂණය මත පදනම් වූ ඩිජිටල්කරණය කරන ලද මූල්‍ය සේවාවන්හි උපායමාර්ගික ආයෝජන ප්‍රවර්ධනය කිරීමට ද මෙමගින් අපේක්ෂා කෙරේ. ඊට අමතරව, බැංකු අංශය පුරා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන අතරම, මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් පුළුල් කිරීමට ඒකාබද්ධ කිරීම සහාය වනු ඇත.

### ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය සහ ඉදිරි දැක්ම

ශ්‍රී ලංකා මහ බැංකුව අදාළ බලපත්‍රලාභී බැංකු විසින් සපයන ලද ඒකාබද්ධ කිරීමේ යෝජනා සහ අනෙකුත් තොරතුරු, නියාමන දෘෂ්ටිකෝණයකින් ඇගයීමට ලක් කරනු ලබන අතර, 1988 අංක 30 දරන බැංකු (සංශෝධිත) පනත ප්‍රකාරව අවශ්‍ය අනුමැතීන් ලබා දෙනු ඇත. තවද, සුදුසු අවස්ථාවල දී නිශ්චිත නියාමන මාර්ගෝපදේශ ලබා දෙමින් බැංකු අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රයත්නයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පහසුකම් සපයනු ඇත.

ඒ අනුව, බැංකු අංශය ඒකාබද්ධ කිරීම, මූල්‍යමය හා මෙහෙයුම් වශයෙන් ශක්තිමත් බැංකු සඳහා පහසුකම් සපයනු ලබන අතර, එමගින් ආර්ථිකයේ සාර්ව සහභාගීත්වයක් සහිත තිරසාර වර්ධනයකට සහාය වෙමින් බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථායිතාවය ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.